*සැ. යු.* - 2015.01.16 දින පළ වූ අංක 1,898 *දරන ගැසට් පත්‍රයේ* II සහ III කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,899 - 2015 ජනවාරි මස 23 වැනි සිකුරාදා - 2015.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සැම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 88 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 89 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 93 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 95 |

*සැ. යු.* - ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත 2014 දෙසැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 පෙබරවාරි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* *www. documents.gov. lk* *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**මාලිගාවත්ත දුම්රිය අංගනයේ තිබෙන ගර්හිත මැදිරි හා දෙමටගොඩ වැඩපල අංක 26 හි ඇති ගර්හිත දුම්රිය එන්ජින් ඉවත් කිරීම - SRS/F 7205**

01. මාලිගාවත්ත දුම්රිය අංගනයේ තිබෙන ගර්හිත දුම්රිය මැදිරි හා දෙමටගොඩ වැඩපල අංක 26 හි ඇති ගර්හිත දුම්රිය එන්ජින් ඉවත් කිරීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් මුද්‍රා තබන ලද ලංසු මෙයින් භාරගැනේ.

02. කිසියම් ලංසුකරුවෙකු විසින් යම් තෝරාගත් දුම්රිය මැදිරි හෝ දුම්රිය ඇන්ජින් සංඛ්‍යාවක් මිලදී ගැනීමට අදහස් කරන්නේ නම් ඔහුට හෝ ඇයට ඒ සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. එසේ කිරීමේ දී ඔහු හෝ ඇය විසින් එකී තෝරාගත් දුම්රිය දුම්රිය මැදිරි හා දුම්රිය එන්ජින් සඳහා පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර ඔහු හෝ ඇය විසින් බර කිරීමකින් තොරව ප්‍රමාණ පත්‍රයන් හි සඳහන් බර සඳහා ඔබ විසින් ඉදිරිපත් කළ මිල ගණන් අනුව මුදල් ගෙවා තෝරාගත් අයිතමයන් සම්පූර්ණයෙන් මිල දී ගත යුතු යි.

03. 2015.01.21 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

04. ආපසු නොගෙවන රු. පන්දහසක (රු. 5,000) ලියවිලි ගාස්තුවක් දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ගෙවා 2015.01.20 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගන්නා ආකෘති පත්‍ර මත පමණක් ලංසු සටහන් කළ යුතුයි.

05. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ දී ලංසු භාර ගැනීම අවසන් කළ වහාම, එම ලංසු විවෘත කරනු ලබන අතර ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

06. ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙනවිත් පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුයි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

07. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු ලියවිලි ගාස්තුවකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

08. වැඩිමනත් විස්තර සඳහා කරුණාකර, කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී තැන දුරකථන අංක 2438078/2436818 හා ෆැක්ස් අංක 2432044 ඔස්සේ අමතන්න.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7205

01-635

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**මාලිගාවත්තේ දුම්රිය මැදිරි සහ හයිඩ්‍රොලික් ලොකොමොටිව් එන්ජින් නවත්වන ස්ථානය සඳහා පිරිසිදු කිරීමේ සේවාවන් සැපයීම**

01. කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය (ප්‍රධාන) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, මාලිගාවත්ත අංගනයේ මගී දුම්රිය මැදිරි හා හයිඩ්‍රොලික් ලොකොමොටිව් එන්ජින් නවතා තබන ස්ථානයේ (DMUU) සඳහා වසර දෙකක කාලයක් තුළ පිරිසිදු කිරීමේ සේවා සැපයීම සඳහා රජයේ සහ/හෝ පෞද්ගලික ආයතන වෙත දැනටමත් පිරිසිදු කිරීමේ සේවාවන් සැපයීමේ ප්‍රමාණවත් පළපුරුද්ද සහිත පිළිගත් සමාගම් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් 2015.01.29 ප. ව. 3.00 දක්වා ආපසු නොගෙවන රු. 2,500 ක ගාස්තුවක් ගෙවීම මත, ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

3. 2015.01.30 වැනි දින ප. ව. 2.00 ට ලංසු අවසන් කරනු ලබන අතර, ඒ විගසින් ම කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී, ලංසු විවෘත කිරීම සිදුකරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීමට පුළුවන.

4. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම කළ යුත්තේ,

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

05. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂාකර බැලිය හැකි අතර, වැඩිමනත් විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ 10
දුරකථන අංක : 2438078 හෝ 2436818
ෆැක්ස් අංකය : 2432044.

සභාපති,
(ප්‍රධාන) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7203

01-636

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - අත්තනගල්ල

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ හා අධිකරණ කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව, රාජසන්තක කරනු ලැබූ සහ, මෙතෙක් හිමිකම් නොකියන ලද, නඩු භාණ්ඩ හා අධිකරණ කාර්යාලයෙන් භාවිතයෙන් ඉවත් කරන ලද පහත සඳහන් භාණ්ඩ, 2015.02.19 වැනි දින, පෙ. ව. 12.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පැවැත්වෙන දින එය, ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

3. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකි ය.

4. වෙන්දේසියේ මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදින, ප. ව. 4.00 ට පෙර ඉවත් කරගත යුතු ය.

5. වෙන්දේසියෙන් මිල දී ගන්නා ද්‍රව්‍යයන් සඳහා, ගැනුම්කරු විසින් තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා, පිළිගත හැකි හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

6. වෙන්දේසිය අවසානයේදී අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවලදී ඉදිරිපත් කළ භාණ්ඩ සම්බන්ධව, අවසන් තීරණය ගරු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව දන්වා සිටිමි.

එම්. වයි. එම්. ඉර්ෂඩීන්,
දිස්ත්‍රික් විනිශ්චයකාර/මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
අත්තනගල්ල.

2015 ජනවාරි මස 06 වැනි දින,
අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | 39778 | මිරිස් ගලක් සහ අත් ගල |
| 02. | 74912 | ගෑස් ලිප හා ගෑස් සිලින්ඩරය |
| 03. | 77253 | පාවහන් යුගලය |
| 04. | 77254 | කාන්තා සාය 01 |
| 05. | 79578 | ගෑස් සිලින්ඩරය හා ගෑස් ලිප |
| 06. | 79717 | ගණක යන්ත්‍ර 01 |
| 07. | 79718 | වයර් කෝඩ් 01 |
| 08. | 79721 | ත්‍රීවිල් හෝන් 01 |
| 09. | 79722 | පාවහන් යුගලය |
| 10. | 79723 | සරමක් |
| 11. | 80064 | ගෑස් ලිප් 01ක් හා ගෑස් සිලින්ඩරය |
| 12. | 80124 | සණක යන්ත්‍රයක් |
| 13. | 80130 | L. E. D. ලයිට් 01 |
| 14. | 80131 | විදුලි පන්දමක් |
| 15. | 80133 | විදුලි බුබුලු වැලක් |
| 16. | 80134 | C. C. I. රිසීවරය |
| 17. | 80149 | නාන කාමර තිර රෙදි 01 |
| 18. | 80150 | බේබි බෑග් 01 |
| 19. | 80152 | උණුසුම් බෝතල් 01 |
| 20. | 81078 | දුරකථන චාර්ජරය |
| 21. | 81079 | වයර් කෝඩ් 01 |
| 22. | 81083 | රයිනෝ ඇස්බැස්ටෝස් සීට් 01 |
| 23. | 81724 | ගෑස් ලිප හා ගෑස් සිලින්ඩරය |
| 24. | 81966 | වයර් කෝඩ් 01 |
| 25. | 81967 | වයර් කෝඩ් 01 |
| 26. | 81968 | විදුලි බුබුලු වැලක් |
| 27. | 81970 | රෙදි මීටර් 02 |
| 28. | 82192 | බවුත් එකක් |
| 29. | 82193 | දුරකථන චාර්ජරය |
| 30. | 82194 | පවර් කෝඩ් 01 |
| 31. | 82195 | දුරකථන චාර්ජරය |
| 32. | 82381 | කුඩා තුවා එකක් |
| 33. | 82552 | ගෑස් ලිප හා ගෑස් සිලින්ඩරය |
| 34. | 82835 | වතුර බටයක් |
| 35. | 82836 | කුඩා තුවායක් |
| 36. | 82844 | විදුලි පන්දමක් |
| 37. | 83000 | ගෑස් ලිප හා ගෑස් සිලින්ඩරය |
| 38. | 83816 | උදලු 01, සවල් 01, වේවැල් කූඩ 01, පිහි 01, ගිරය, ප්ලාස්ටික් බකට් 01 |
| 39. | 83994 | කාන්තා සාය 01 |
| 40. | 83987 | වීදුරු පෙට්ටි 01 |
| 41. | 84000 | වයර් කෝඩ් 01 |
| 42. | 84217 | එෆ්. එම්. මොඩියුලේටර් 01 (Modulater) |
| 43. | 84693 | පවර් පැක් එකක් |
| 44. | 84695 | ඇඳුමක් |
| 45. | 85429 | ජල කරාමයක් |
| 46. | 86269 | කුලු ගෙඩි 01 |
| 47. | 86271 | කුලු ගෙඩි 01 |
| 48. | 86611 | ඔප්ටිකල් මවුස් 01 |
| 49. | 86612 | ගණක යන්ත්‍ර 01 |
| 50. | 86613 | විදුලි පන්දම් 01 |
| 51. | 87102 | ඉලෙක්ට්‍රික් බවුත් 01 |
| 52. | 87103 | චයිනීස් වෙල්වට් 01 |
| 53. | 87104 | කමිස 01 |
| 54. | 88342 | ගස් කපන මැෂින් කියත් 01, අත් කියත් 01 |
| 55. | 89433 | ළදරු පාවහන් යුගලය |
| 56. | 88435 | 1/2 ජල කරාම 01 |
| 57. | 89436 | කුෂන් කවර 01 |
| 58. | 89437 | දොර ලොක් 01 |
| 59. | 89432 | ගණක යන්ත්‍ර 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 60. | 89768 | ඇලුමිනියම් කලය |
| 61. | 89930 | බවුත් එකක් |
| 62. | 89931 | විදුලි පන්දම් 01 |
| 63. | 89934 | වයර් කෝඩ් 01 |
| 64. | 90019 | ගෑස් ලිප හා ගෑස් සිලින්ඩරය |
| 65. | 90126 | චාර්ජර් 01 |
| 66. | 90127 | කොම්පියුටර් මවුස් 4 |
| 67. | 90128 | ගණක යන්ත්‍ර 01 |
| 68. | 90182 | පාවහන් යුගලය |
| 69. | 90184 | සරම් 01 |
| 70. | 90187 | සොස් ෆෑන් 01 |
| 71. | 90190 | චීත්ත 01 |
| 72. | 90191 | බේබි ඇඳුම් 01 |
| 73. | 90194 | දුරකථන චාර්ජරය |
| 74. | 90195 | විදුලි පන්දම් 01 |
| 75. | 90858 | වයර් කෝඩ් 01 |
| 76. | 90859 | විදුලි පන්දම් 01 |
| 77. | 90860 | දුරකථන චාර්ජරය |
| 78. | 90864 | තීත්ත රෙදි යාර 2 1/2 |
| 79. | 93342 | ගෑස් ලිප් 01 |
| 80. | 94422 | පොප්ලින් යාර 01 |
| 81. | 94427 | ටී ෂර්ට් 01 |
| 82. | 95213 | ගෑස් ලිප |
| 83. | 95805 | අඟලේ ෂොකට් 02 |
| 84. | 95807 | මල්ටි ප්ලග් එකක් |
| 85. | 95816 | මික්ෂර් එකක් |
| 86. | 95817 | දුරකථන චාර්ජයක් |
| 87. | 96429 | යකඩ සවල් 01, බාල්දි 01 |
| 88. | 96539 | පාවහන් ජෝඩුවක් |
| 89. | 96543 | විදුලි හීටර් 01 |
| 90. | 96546 | 1/2 බෝල් වැල් 01 |
| 91. | 97107 | සුදු යකඩ බැරල් එකක් |
| 92. | 73867 | තීන්ත ලීටර් 1ක් |
| 93. | 92725 | මවුස් එකක් |
| 94. | 92726 | විදුලි පන්දමක් |
| 95. | 92716 | කාන්තා අත් බෑගයක් |
| 96. | 92713 | දුරකථන චාර්ජරයක් |
| 97. | 92710 | මල්ටි ප්ලග් එකක් |
| 98. | 92709 | වතුර බෝතලයක් |
| 99. | 80125 | විදුලි පන්දමක් |
| 100. | 91600 | බෑග් එකක් |
| 101. | 91595 | හැන්ඩ් ලැම්ප් එකක් |
| 102. | 91599 | ජල කරාමයක් |
| 103. | 93200 | රූපවාහිනී දුරස්ථ පාලකය |
| 104. | 93199 | දඟර වානේ කම්බි 02 |
| 105. | 97554 | රබර් ජලනල රෝලක් |
| 106. | 97560 | මල්ටි ප්ලග් එකක් |
| 107. | 97539 | මවුස් එකක් |
| 108. | 71654 | තීන්ත ලීටර් 04 |
| 109. | 98384 | විදුලි පන්දමක් |
| 110. | 98385 | දුරකථන චාර්ජරයක් |
| 111. | 98391 | සනක යන්ත්‍රයක් |
| 112. | 98394 | බැටරි ඇසුරුමක් |
| 113. | 98398 | රබර් ජලනල රෝලක් |
| 114. | අංක රහිත | විවිධ වර්ගයන්ගෙන් යුත් දිරාපත්වී ඇති පාපැදි 44 |
| 115. | අංක රහිත | යකඩ බැරල් තොගයක් |
| 116. | අංක රහිත | හිස් වීදුරු බෝතල් තොගයක් |
| 117. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් තොගයක් |
| 118. | AR 08/14 | සෝනි වර්ගයේ D. V. D. යන්ත්‍රය |
| 119. | අංක රහිත | අංක රහිත දිරාපත්ව ඇති පාපැදි කොටස් |

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයෙන් වෙන්දේසියට නියම කළ තක්සේරු මණ්ඩලය මගින් තක්සේරු කරන ලද බඩු වට්ටෝරු පොතට අදාළ වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව

120. යතුරු ලියන ඔලිම්පියා සිංහල 6910383
121. යතුරු ලියන පැසිස්ට් සිංහල 602990
122. යතුරු ලියන ඔප්ටිමා සිංහල 547289
123. යතුරු ලියන ඔප්ටිමා සිංහල 547231
124. යතුරු ලියන ඔලිම්පියා සිංහල 7106083
125. යතුරු ලියන ඔප්ටිමා සිංහල 496490
126. යතුරු ලියන පැප්සට් සිංහල 591058
127. යතුරු ලියන ඔප්ටිමා සිංහල 488210
128. වානේ අල්මාරි 06
129. අල්මාරි ලී 02
130. කැබිනට් වානේ ලාච්චු දෙකේ 01
131. ජීද්‍රාකරණ 01
132. දුරකථන 01
133. බෙන්ච් (විනිසුරු ආසන) 01
134. පුටු ඇඳි සහිත 10
135. ෆැක්ස් මැෂින් 02
    (i) වී 616257448630
    (ii) 13382 - 93
136. බිත්ති කුඩු 01
137. බංකු 06
138. මේස ලිපිකරු 03
139. ඡායා පිටපත් යන්ත්‍ර 01
140. පරිගණක මුද්‍රණ යන්ත්‍ර
    995300/994 RF 3 V
    99437/994 D 31 Y
    9944/9958 Y 3 W
    9943/994 RE 45
141. බිත්ති ඔරලෝසු 01
142. කැබිනට් වානේ ලාච්චු හතරේ 07
143. බංකු ඇඳි සහිත 02
144. ටේබල් ෆෑන් 01
145. ස්ටේප්ලර් මැෂින් 04
146. ටයර් 02
147. දින මුද්‍රා 01

**මහෙස්ත්‍රාත් අධිකරණය - හොරණ**

නඩු භාණ්ඩ වෙන්දේසිය

හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කර ඇති මෙහි පහත උපලේඛනයේ සඳහන් නඩු භාණ්ඩ 2015.02.07 වැනි සෙනසුරාදා දින පෙ. ව. 10.00 ට හොරණ මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. ඉහත සඳහන් නඩු භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ වීමට පැය 1/2කට පෙර ගැණුම්කරුවන්ට පරීක්ෂා කළ හැකි ය.

03. අධිකරණය විසින් නියම කරන ලංසුව අවම ලංසුව වන අතර, එය පිළිනොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි අදාළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

04. වෙන්දේසියෙන් මිලට ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කරවා ගත යුතු අතර, ගෙවීම් මුදල් මගින් පමණක් සිදුකළ යුතු ය.

05. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් නඩු භාණ්ඩයක් පිළිබඳව හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

06. භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ලෝචනී ප්‍රදීපා අබේවික්‍රම වීරසිංහ,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
හොරණ.

2015 ජනවාරි මස 05 වැනි දින,
හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**හොරණ මහෙස්ත්‍රාත් අධිකරණය**

*නඩු භාණ්ඩ වෙන්දේසිය - 2014*

භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|---|
| 01. | 81620 | | පැදුරු | 01යි |
| 02. | 95264 | | පැදුරු | 01යි |
| 03. | 88468 | | පැදුරු | 01යි |
| 04. | 88973 | | පැදුරු | 01යි |
| 05. | 98748 | | පැදුරු | 01යි |
| 06. | 96176 | | පැදුරු | 01යි |
| 07. | 96177 | | පැදුරු | 01යි |
| 08. | 99263 | | පැදුරු | 01යි |
| 09. | 86867 | | ජල කරාම | 01යි |
| 10. | 99634 | | ජල කරාම | 01යි |
| 11. | 97732 | | ජංගම දුරකථන චාජර් | 01යි |
| 12. | 98535 | | ජංගම දුරකථන චාජර් | 01යි |
| 13. | 1012 | | ජංගම දුරකථන චාජර් | 01යි |
| 14. | 67059 | (i) | කිරි පිහි | 01යි |
| | | (ii) | ප්ලාස්ටික් බාස්කට් | 01යි |
| 15. | 23898 | (i) | මන්නාපිහි | 01යි |
| | | (ii) | ප්ලාස්ටික් බාස්කට් | 01යි |
| 16. | 86826 | | ප්ලාස්ටික් බාස්කට් | 02යි |
| 17. | 85647 | | ප්ලාස්ටික් බාස්කට් | 01යි |
| 18. | 31115 | | ඉටිකපන කටර් අඩු | 01යි |
| 19. | AR 1779/13 | | මේස පිහි | 01යි |
| 20. | AR 1783/13 | | මන්නා පිහි | 01යි |
| 21. | AR 1781/13 | | මන්නා පිහි | 01යි |
| 22. | AR 1780/13 | | මන්නා පිහි | 01යි |
| 23. | AR 731/14 | (i) | පොරව | 02යි |
| | | (ii) | පිහි | 08යි |
| 24. | 00010 | (i) | බන්ඩි කියත් | 01යි |
| | | (ii) | යකඩ | 01යි |
| | | (iii) | මිටි | 01යි |
| | | (iv) | පොඩි පිහි | 01යි |
| | | (v) | උදළු | 01යි |
| | | (vi) | පොරව | 01යි |
| 25. | AR 1826/13 | | බදාම තාච්චි | 01යි |
| 26. | AR 1782/13 | | අත් පොරව | 01යි |
| 27. | 92394 | | ගැරුම් වට්ටි | 01යි |
| 28. | 96741 | (i) | කුඩ | 01යි |
| | | (ii) | බාල්දි | 01යි |
| 29. | 91387 | (i) | සවල් | 01යි |
| | | (ii) | බාල්දි | 01යි |
| 30. | 90379 | | බාල්දි | 01යි |
| 31. | 64566 | (i) | බාල්දි | 02යි |
| | | (ii) | කුඩ | 01යි |
| 32. | 80085 | | බාල්දි | 01යි |
| 33. | 82097 | | බාල්දි | 01යි |
| 34. | 75725 | | බාල්දි | 01යි |
| 35. | 66830 | | බාල්දි | 01යි |
| 36. | 63060 | | බාල්දි | 01යි |
| 37. | 86408 | | සවල් | 01යි |
| 38. | 99551 | | සවල් | 01යි |
| 39. | 98665 | (i) | උදළු | 01යි |
| | | (ii) | ප්ලාස්ටික් බාල්දි | 01යි |
| 40. | 98749 | | රෙදි කාපට් | 01යි |
| 41. | 90136 | | ටෙන්ට් රෙදි | 01යි |
| 42. | 92393 | | ඇලුමිනියම් කල | 01යි |
| 43. | 64537 | | රබර් ෂීට් | 03යි |
| 44. | 30346 | | රබර් ෂීට් | 02යි |
| 45. | 773/14 | | විදුලි පන්දම් | 01යි |
| 46. | 63144 | | හෙල්මට් | 02යි |
| 47. | 22896 | | හෙල්මට් | 01යි |
| 48. | AR 1596/10 | | ඇලුමිනියම් තාච්චි | 02යි |
| 49. | 13936 | | ඇලුමිනියම් වලං | 01යි |
| 50. | 17395 | | ටයි ජැක් | 01යි |
| 51. | 78566 | | ජංගම දුරකථන | 01යි |
| 52. | 75158 | | Kalino වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 53. | 76147 | | ඉසිටෙල් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 54. | 71727 | | G - TIDE වර්ගයේ ජංගම දුරකථන | 01යි |

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|---|
| 55. | 77591 | | ජංගම දුරකථන | 01යි |
| 56. | 78567 | | ජංගම දුරකථන | 01යි |
| 57. | 78106 | | ජංගම දුරකථන | 01යි |
| 58. | 78085 | | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 59. | 73883 | | බර්ඩ් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 60. | 78716 | | ජංගම දුරකථන | 01යි |
| 61. | 8897 | (i) | කැසට් යන්ත්‍ර | 01යි |
| | | (ii) | බපල් | 02යි |
| | | (iii) | ඩෙක් යන්ත්‍ර | 01යි |
| 62. | 66579 | | විදුලි ඉස්ත්‍රික්ක | 02යි |
| 63. | AR10/13 | (i) | අඩි 04ක් පමණ දිග යකඩ ගල් ඉණි | 02යි |
| | | (ii) | කුළු ගෙඩි | 01යි |
| | | (iii) | හිමෝ වර්ගයේ වාහන ජැක් | 01යි |
| 64. | 93403 | | පරණ වාහනවල ගෙවී ගිය කොටස් අඩංගු පාර්සලය | |
| 65. | AR1757/13 | | ඇම්පියර් 120 සුදු පාට වාහන බැටරි | 02යි |
| 66. | 88889 | | වාහන බැටරි | 01යි |
| 67. | AR205/14 | | විදුලි මෝටර් | 01යි |
| 68. | AR204/14 | | වායු සමීකරණ යන්ත්‍ර | 01යි |
| 69. | 81519 | | වතුර මෝටර් | 01යි |
| 70. | 79759 | (i) | දියේ ගිල්විය හැකි වතුර මෝටර් | 01යි |
| | | (ii) | පවර් ටෙක් වර්ගයේ වතුර මෝටර් | 02යි |
| | | (iii) | ගල් විදින උපකරණ | 02යි |
| | | (iv) | ග්‍රයින්ඩර් | 01යි |
| | | (v) | වායු පීඩන යන්ත්‍ර | 01යි |
| | | (vi) | ස්පැනර් | 01යි |
| | | (vii) | ගල් විදින උපකරණවලට යොදන ගල් කටු 06යි | |
| | | (viii) | කුළු ගෙඩි | 01යි |
| | | (xi) | ග්‍රැගන් ලයිට් | 01යි |
| | | (x) | විදුලි පන්දම් | 01යි |
| | | (xi) | පාවිච්චි කරන ලද වයර් රෝල් | 03යි |
| | | (xii) | වොට් 500 හැලඩන් ලයිට් | 01යි |
| | | (xiii) | අඩි 100 දිග පීඩන බට | 01යි |
| | | (xiv) | අඩි 48 දිග කැන්වස් බටයක් සහ එස්ලෝන් බට කීපයක් | |
| | | (xv) | අමුරෙදි කැබලි 02ක් හා කොළ පැහැති බටයක් | |
| | | (xvi) | කම්පෙෂර් මැෂින් | 01යි |
| 71. | 66936 | (i) | රයිස් කුකර් | 01යි |
| | | (ii) | සබ්වුෆර් | 01යි |
| 72. | 65915 | | නළ ළිඳක කොටසක් | |
| 73. | 73336 | | මොනිටරය, කොටස් ගැලවී ගිය CPU යන්ත්‍රය හා කේබල් 01යි | |
| 74. | 70118 | | කොටස් ගැලවී ගිය CPU යන්ත්‍රය | |
| 75. | 76708 | (i) | පුත්කලස් | 01යි |
| | | (ii) | පිත්තල යයි කියන ටීකප් | 01යි |
| | | (iii) | රිදී යැයි කියන ටී කප් | 01යි |
| | | (iv) | කරාබු ජෝඩුවක් | |
| | | (v) | රන් කැබැල්ලක් | |
| 76. | 83401 | | රන් ආලේපිත බව කියන වළලු 06යි | |
| 77. | 69524 | | රන් මාලයක කොටසක් | |
| 78. | 1989 | | ව්‍යාජ රන් වළලු | 04යි |
| 79. | 52362 | (i) | රන් ආලේපිත රිදී මාල | 01යි |
| | | (ii) | රන් යැයි කියනු ලබන කැබැල්ලක් | |
| 80. | 23158 | | රන් මාල | 01යි |
| 81. | 67681 | | කාන්තා රන් මුදු | 01යි |
| 82. | 67720 | | රන් යැයි කියනු ලබන කාසි | 02යි |
| 83. | 8898 | | බැරල් හැඩති ජිප්සි කරාබු ජෝඩු 01යි | |
| 84. | AR 1544/13 | | පා පැදිය | |
| 85. | 16017 | | අංක 132-2111 යතුරු පැදි | 01යි |
| 86. | 36438 | | NWJE 5408 යතුරු පැදි | 01යි |
| 87. | AR 1464/13 | (i) | අංක SPMN - 2457 යතුරු පැදිය | |
| | | (ii) | අංක 131 - 4161 යතුරුපැදිය | |
| | | (iii) | අංක 8 - 7784 යතුරු පැදිය | |
| 88. | AR 1589/10 | | අංක 144 - 7043 යතුරු පැදිය | |
| 89. | 94773 | | අංක - 4725 යතුරු පැදිය | |
| 90. | AR 914/14 | | අංක 138 - 7905 යතුරු පැදිය | |
| 91. | AR 913/14 | | අංක HG - 3012 යතුරු පැදිය | |
| 92. | 69273 | | WPUT 9070 යතුරු පැදිය | |
| 93. | AR 678/14 | (i) | යමහා වර්ගයේ යතුරු පැදිය | |
| | | (ii) | මෝපේඩ් වර්ගයේ යතුරු පැදිය | |
| | | (iii) | හීරෝ හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය | |
| | | (iv) | සියග්‍රා වර්ගයේ යතුරු පැදිය | |
| | | (v) | රනෝමොටෝ වර්ගයේ යතුරු පැදිය | |
| | | (vi) | හීරෝ හොණ්ඩා 125 යතුරු පැදිය | |
| | | (vii) | DTX 125 ට්‍රේල් වර්ගයේ යතුරු පැදිය | |
| | | (viii) | චතුමා වර්ගයේ 125 යතුරු පැදිය | |
| | | (ix) | බජාජ් 135 යතුරු පැදිය | |
| | | (x) | වැලි වර්ගයේ යතුරු පැදිය | |
| | | (xi) | වැලි වර්ගයේ යතුරු පැදිය | |
| | | (xii) | වැලි වර්ගයේ යතුරු පැදිය | |
| | | (xiii) | මෝපේඩ් වර්ගයේ යතුරු පැදිය | |
| 94. | 95197 | | අංක WPWQ - 4918 යතුරු පැදිය | |
| 95. | AR 847/14 | | අංක 160 - 8007 යතුරු පැදිය | |
| 96. | AR 846/14 | | අංක 81 - 1364 යතුරු පැදිය | |
| 97. | AR 845/14 | | අංක 135- 0686 යතුරු පැදිය | |
| 98. | AR 844/14 | | අංක 137 - 2968 යතුරුපැදිය | |
| 99. | AR 843/14 | | අංක 121 - 6570 යතුරු පැදිය | |
| 100. | AR 797/14 | | අංක 97- 4502 යතුරු පැදිය | |
| 101. | AR 796/14 | | අංක 114 - 8169 යතුරු පැදිය | |
| 102. | AR 795/14 | | අංක 81 - 7400 යතුරු පැදිය | |
| 103. | 46544 | | අංක 21 - 1934 ත්‍රීරෝ රථය | |
| 104. | 66420 | | ගෑස් උදුන් | 01යි |
| 105. | 95552 | (i) | කුඩා ගෑස් සිලින්ඩර් | 01යි |
| | | (ii) | ගෑස් උදුන් | 01යි |
| 106. | 87344 | (i) | ඩී. වී. ඩී. යන්ත්‍ර | 01යි |

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|---|
| | | (ii) | කුඩා ගෑස් සිලින්ඩර් | 01යි |
| | | (iii) | ජිනසේන වර්ගයේ වතුර මෝටර් | 01යි |
| 107. | 96774 | | ගෑස් උදුන් | 01යි |
| 108. | 97331 | (i) | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | (ii) | ගෑස් උදුන් | 01යි |
| 109. | 69581 | | ගෑස් සිලින්ඩර් | 01යි |
| 110. | 98195 | | කුඩා ගෑස් උදුන් | 01යි |
| 111. | 97673 | (i) | ගෑස් උදුන් | 01යි |
| | | (ii) | ගෑස් සිලින්ඩර් | 01යි |
| 112. | 98757 | | ගෑස් උදුන් | 01යි |
| 113. | 716 | (i) | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | (ii) | ගෑස් උදුන් | 01යි |
| 114. | අංක රහිත | | ගැරුම් වට්ටි | 04යි |
| 115. | අංක රහිත | | පැදුරු | 01යි |
| 116. | අංක රහිත | | වැලි ගොඩ දමන බාල්දි | 02යි |
| 117. | අංක රහිත | | කොක්ක රහිත බාල්දි | 01යි |
| 118. | අංක රහිත | | ඇඳුම් උදලු | 01යි |
| 119. | අංක රහිත | | රෙදි කාපට් | 01යි |
| 120. | අංක රහිත | | රබර් ෂීට් | 16යි |
| 121. | අංක රහිත | | ඔට්ට පාළු කිලෝ 03යි | |

01-623

---

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියට අනුව පහත දැක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සරත් ලෑන්ඩ්ස්කේප්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 88/8/21, සමිඳු උයන,
මාවිත්තර, පිළියන්දල,
ලි. ප. අංකය : පී වී 101117
ලි. ප. දිනය : 2014.09.25

සුප්‍රීම් කොමර්ෂල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 71, මාකොළ දකුණ, මාකොළ
ලි. ප. අංකය : පී වී 101326
ලි. ප. දිනය : 2014.10.07

බ්‍රයිට්ස් ක්ලෝතිං (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 73/3ඒ, මාකන්දන, මඩපාත, පිළියන්දල
ලි. ප. අංකය : පී වී 100521 ලි. ප. දිනය : 2014.08.27

ඉසුරු ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 247/බී, ගාලු පාර, මොරටුව
ලි. ප. අංකය : පී වී 68849
ලි. ප. දිනය : 2009.08.19

නේවර් ක්‍රියේෂන්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 39/6, සර්වෝදය පාර, අළුත්ගම, බණ්ඩාරගම
ලි. ප. අංකය : පී වී 85132
ලි. ප. දිනය : 2012.03.26

චේම්බර් ඔෆ් ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් ඉන්ෆොමේෂන් සර්විසස්
අංක 287/7, ශ්‍රී දේවානන්ද පාර, තුම්බෝවිල, පිළියන්දල
ලි. ප. අංකය : ජී ඒ 2981
ලි. ප. දිනය : 2014.11.17

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-524

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සමාගමේ නම 2014 දෙසැම්බර් මස 09 වැනි දින සිට වෙනස් කර ඇත.

පැරණි නම : ජයලත් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
අළුත් නම : ජයලත් කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලි. ප. අංකය : පීවී 68425
ලි. ප. ලිපිනය : අංක 124/ඒ, හොරණ පාර, පොල්ගස්ඕවිට හන්දිය,

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් පුද්ගලික, (සමාගම)
සමාගම් ලේකම්වරු.

01-525

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ගුරුතලාව ඔක්ස්ෆෝඩ් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 101940
සංස්ථාගත කළ දිනය : 2014.11.14
ලියාපදිංචි කාර්යාලය : අංක 186, ගල්ගොඩ, ගුරුතලාව.

අධ්‍යක්ෂක.

01-526

## නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (2) වගන්තිය ප්‍රකාරව සමාගමේ නාමය වෙනස් කිරීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : හේමාස් පවර් පීඑල්සී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 415 PBPQ
සමාගමේ ලියාපදිංචි ලිපිනය : හේමාස් හවුස්, අංක 75, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02
සමාගමේ නව නාමය : රීසස් එනර්ජි පීඑල්සී

රීසස් එනර්ජි පීඑල්සී වෙනුවෙන්
හේමාස් කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

01-610

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2014 දෙසැම්බර් මස 16 වැනි දින ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ඔරිජින් කියුබ්ඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102645
ලියාපදිංචි කාර්යාලය : 4 වැනි මහල, අංක 2, කාසල් පටුමග, කොළඹ.

එස්ජේ කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

4 වන මහල, අංක 2,
කාසල් පටුමග, කොළඹ 4.

01-548

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2014 දෙසැම්බර් මස 18 වැනි දින ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : නෙක්ස්ට්ජෙන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102817
ලියාපදිංචි කාර්යාලය : අංක 752/1, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 9.

එස්ජේ කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

4 වන මහල, අංක 2,
කාසල් පටුමග, කොළඹ 4.

01-550

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

2010 මාර්තු මස 22 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 71616 යටතේ "ජෝශප් ලුයිස් ගැලරි (පීවීටී) එල්ටීඩී" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය, අංක 53, ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 05 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

ජෝශප් ලුයිස් ගැලරි (පීවීටී) එල්ටීඩී.

අංක 53,
ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 05.

01-540

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නුගේගොඩ පාගොඩ පාරේ, දියවන්නා උද්‍යානයේ, අංක 23/25 දැනට ඕස්ට්‍රේලියා මෙල්බන් GPO Box 3031 හි පදිංචි වැලන්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු (ජාතික හැඳුනුම්පත් අංක 670463133 වී) වන මා විසින් ලියා අත්සන් කරන ලද අධි නීතිඥ හා සොලිස්ටර්වරු පීටර් තිරු විසින් ඔස්ට්‍රේලියාවේ දී වර්ෂ 2013 මාර්තු 19 වැනි දින ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 517/6, බෝධිරාජ මාවත, තලවතුගොඩ හි පදිංචි චරිතා චතුරංගනී කොට්ටච්චි වෙත පවරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර එම ඇටෝර්නි බලපත්‍රය අහෝසි කරන බවත් මින් ඉදිරියට වර්ෂ 2014 දෙසැම්බර් මස 30 වැනි දින සිට ඇය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි.

වැලන්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු.

2014 දෙසැම්බර් මස 30 වැනි දින.

01-542

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නුගේගොඩ පාගොඩ පාරේ, දියවන්නා උද්‍යානයේ, අංක 23/25 දැනට ඕස්ට්‍රේලියා මෙල්බන් GPO Box 3031 හි පදිංචි වැලන්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු (ජාතික හැඳුනුම්පත් අංක 670463133 V) වන මා විසින් ලියා අත්සන් කරන ලද අධි නීතිඥ හා සොලිස්ටර්වරු පීටර් තිරු විසින් ඔස්ට්‍රේලියාවේ දී වර්ෂ 2014 පෙබරවාරි 01 වැනි දින ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 517/6, බෝධිරාජ මාවත, තලවතුගොඩ හි පදිංචි චරිතා චතුරංගනී කොට්ටච්චි වෙත පවරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර එම ඇටෝර්නි බලපත්‍රය අහෝසි කරන බවත් මින් ඉදිරියට වර්ෂ 2014 දෙසැම්බර් මස 30 වැනි දින සිට ඇය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි.

වැලන්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු.

2014 දෙසැම්බර් මස 30 වැනි දින.

01-543

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත 09 (01) වගන්තිය ප්‍රකාරව ඊස්ට් ඒෂියා ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 දෙසැම්බර් මස 09 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඊස්ට් ඒෂියා ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 102706
ලියාපදිංචි ලිපිනය : 73, එගොඩවත්ත පාර, බොරලැස්ගමුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8244 495/077 8197 041

01-633/1

---

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත 09 (01) වගන්තිය ප්‍රකාරව පල්ලේවෙල එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 දෙසැම්බර් මස 26 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : පල්ලේවෙල එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 103 040
ලියාපදිංචි ලිපිනය : 378/7, සිංහ පෙදෙස, කොස්වත්ත පාර, කළපලුවාව, රාජගිරිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ප්‍රවර්ධකයෝ.

දුරකථන අංක : 071 8244 495/077 8197 041

01-633/2

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන ජේදය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

සමාගමේ නම : ආනා වර්ඩ් (පෞද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : තොටගමුව, හික්කඩුව
ලියාපදිංචි අංකය : පී වී 101467
ලියාපදිංචි කළ දිනය : 2014.11.13

සාරුගේ සම්පත් වසන්ත,
අධ්‍යක්ෂ.

01-630

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මීගමුව, කෙලින් වීදිය, අංක 53 හි ජී. ඒ. ඇල්. පී. දම්මික සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 2009.05.23 දින හා අංක 1180 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාර පමුණුගම, පුල්ලුහේන විජය මාවත අංක 533 දරන තැන පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 776881783 වී හිමි බෝපේආරච්චිගේ දෝන ධම්මිකා ස්වර්ණපාලි වන මා විසින් කොච්චිකඩේ පල්ලන්සේන පාරේ අංක 62/3 දරන තැන පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 722783174 වී හිමි තම්මිටගේ රොෂාන් ප්‍රසන්න පෙරේරා යන අයට ලබාදී තිබූ විශේෂ ඇටෝර්නි බලපත්‍රය මින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එකී ලේඛනය මෙතැන් පටන් අවලංගු ලේඛනයක් බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

බොපේආරච්චිගේ දොන් ධම්මිකා ස්වර්ණපාලි.

01-663

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

මහනුවර, ගලහ, නිලඹේ (මහනුවර බෝවල උපකාර්යාලයේ දිස්ත්‍රික් සංවර්ධන සහා සීමාව තුළ වාරියගොල්ලේ පිහිටා ඇති අක්කර 1යි, රූඩ් 1යි, පර්චස් 24.5 විශාලැති අගනා දේපළ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ උඩ පළාත කඳුකර පහළ කෝරළේ නිලඹේ (මහනුවර බෝවල උපකාර්යාලයේ දිස්ත්‍රික් සංවර්ධන සහා සීමාව ඇතුළත) වාරියගොල්ලේ පිහිටා ඇත්තාවූ ද, ඊසාන දිගින් පහළ කොට්ඨාසයේ ඉතිරි කොටසින් අග්නිදිගින් පහළ කොට්ඨාසයේ ඉතිරි කොටසින් නිරිතදිගින් පාරෙන් හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩමෙන් හා වයඹදිගින් අඩි පාරෙන් හා පහළ කොට්ඨාසයේ ඉතිරි කොටසින් මායිම්වූ ද, අංක 1164 ඒ දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම පහකින් (අ. 1, රූ. 1 පර්. 24.5) යුක්තවූ ද, ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 101/266 වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද "වාරියගොල්ල එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ගල්කිස්ස බලයලත් මිනින්දෝරු ඒ. ජී. ප්‍රනාන්දු මහතා විසින් සාදන ලද අංක 1164 ඒ එල්ආර්සී අංක මහ/239, 198, 200, 205 හා 199 හා 1983 ජූලි මස 11 වැනි දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි ද වේ.

රු. 5,138,432.86 ක මුදලක්, සහ රු. 3,600,000 ක් වූ ප්‍රාග්ධන මුදල මත 2006 අගෝස්තු මස 17 වැනි දින ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද, නඩු ගාස්තු, සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද, අයකර ගැනීම පිණිස (1) කොළඹ 12, මැසෙන්ජර් වීදියේ අංක 105 සහ කොළඹ 04 ගාලු පාරේ අංක 247 සහ ගම්පහ ඉහළ යාගොඩ අංක 190 සී හි පිහිටි රාජසිංහ ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (2) කොළඹ 05 ඩේවිඩ්සන් පාරේ අංක 63 දරන ස්ථානයේ සහ ගම්පහ ඉහළ යාගොඩ අංක 190 සී හි පදිංචි මුත්තයියා විලියම්ස් රාජසිංහම් නොහොත් මුත්තයියා විලියම් රාජසිංහම් යනුවෙන් හඳුන්වනු ලබන අයට විරුද්ධව කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් හවුස් සහ කොළඹ 12 පරණ යොන් වීදියේ අංක 442/ඒ දරන ස්ථානයේ ශාඛාවක් පවත්වාගෙන යනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් විසින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත් (සිවිල්) මහාධිකරණයේ නඩු අංක එච්. සී. (සිවිල්) 294/2007/එම් ආර් දරන නඩුවෙන් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කර ඇති දේපළ මා විසින් 2015 ක් වූ පෙබරවාරි මස 20 වැනි දින පෙරවරු 11.30 කණිසමට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිෂ්ඨ වන මාර්ගය.-* මහනුවර සිට පේරාදෙණිය ප්‍රධාන මාර්ගය ඔස්සේ ගැටඹේ (රජවත්ත) දක්වා ගමන් කර වමට හැරී ගලහ පාරේ කි. මී. 13.30 ක් පමණ වාරියගල මංසන්දිය දක්වා ගමන් කර වමට හැරී වාරියගල තේ කර්මාන්ත ශාලාව පාරේ මීටර් 200 පමණ ගමන් කිරීමෙන් මෙම දේපළට ලඟාවිය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේම වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. (1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු වශයෙන් 2.5% ක්ද, (4) වෙන්දේසිය සඳහා දරන්නට වූ සියළුම වියදම් ද, (5) සෝෂක හා ලිපිකරු ගාස්තු වශයෙන් රු. 2,500 ක මුදලක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 7,500 ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

වැඩිදුර විස්තර සඳහා කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 41 දරන ස්ථානයේ නීතිඥවරුන් හා නොතාරිස්වරුන් වන ජුලියස් ඇන්ඩ් ක්‍රීසි සමාගමෙන් විමසන්න. දුරකථන අංක : 011 2422601 - දිගුව 408.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංකය : 011 - 28736565, 0777 - 672082
ෆැක්ස් අංකය : 011 - 2871184.

01-544

**ඩී එෆ් සී සී බැංකුව - පී එල් සී**
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 433 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

*විකුණුම 1 :*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පෙරිය උප්පෝඩයි ග්‍රාම සේවා වසමේ, මන්මුනෙ පත්තු මඩකලපුව මහ නගර සභා සීමාවට අයත් කොට්ඨාස අංක 8 හි පිහිටි, අංක 50, පාක්කියම් මාවත, සීලාමුනෙ ග්‍රාමය යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිස්සවෙරසිංහ විසින් සාදන ලද 2013 ජනවාරි 14 වැනි දිනැති අංක 15/2013 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 16.33 (හෙක්ටයාර් 0.0413)

එහි පිහිටි ගොඩනැගිල්ල, ළිඳ සහ ඊට අදාළ සියලුම අයිතීන් සමග.

*විකුණුම 2 :*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පෙරිය උප්පෝඩයි ග්‍රාම සේවා වසමේ මන්මුනෙ පත්තු පිහිටි, අංක 39/18, සැකරියස් පාර, කොට්ටමුනෙ යන ලිපිනය දරන, බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිස්සවෙරසිංහ විසින් සාදන ලද 2012 දෙසැම්බර් මස 03 වැනි දිනැති අංක 1628/2012 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ්., පර්. 29 (හෙක්ටයාර් 0.0734)
එහි පිහිටි ගොඩනැගිල්ල, ළිඳ සහ ඊට අදාළ සියලුම අයිතීන් සමග.

උකස්කරුට සහ ඔහුගේ අමුත්තන් ඉංජිනේරුවන්, කොන්ත්‍රාත්කරුවන් ගෘහ නිර්මාණ ශිල්පීන්, කුලී කරුවන්, සේවකයන්, බදුකරුවන්, බලපත්‍රලාභීන් ආරාධිතයන් යන අයට සියළුම අවස්ථාවල සහ මින්මතුවට ඔවුන්ගේ කැමැත්ත සහ අවශ්‍යතාවට අනුව, ඕනෑම අරමුණක් සඳහා, දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ යාමට ඒමට පසු කිරීමට ඇවිදිමින් හෝ වෙනයම් ආකාරයකින් ඔවුන්ගේ අශ්වයන්, ගවයන් හෝ වෙනත් සතුන් මගින් හෝ මෝටර් කාර්රථ, ලොරි රථ මගින් හෝ වෙනත් වාහනයක් මගින් බර පැටවූ හෝ බර නොපටවා පාර දිගේ හෝ පාර මතින් මෙහි විශේෂයෙන් විස්තර කර ඇති සහ එක් ආකාරයක හෝ සියලුම ආකාරයේ අයිතීන්, දිශාවන්, වාසින් සහ අනුබැදි දේපළ හෝ සාමාන්‍ය පරිභෝජනයේ දී භාවිතා වන සතු කරගන්නා සියලුම අයිතීන් සඳහා සම්පූර්ණ සහ නිදහස් අයිතියක් ඇති අතර එම කොටසේ විදුලි කේබල් ඇදීමට ඉහලින් යන වයර් ඇදීමට ජලාපවහන සහ ගෑස් හෝ නළ ජලය සඳහා අදාළ කොටසේ සවිකිරීමට සහ වෙනත් ඕනෑම ආකාරයක ක්‍රියාවක් හෝ ඒ සඳහා උත්සාහයට සම්පූර්ණ අයිතියක් ඇත.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 178 ඒ පෙරිය උප්පෝඩයි ග්‍රාම සේවා වසමේ පිහිටි, අංක 40, සීලාමුනෙ, අම්ර්තකලී යන ලිපිනය දරන බිම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 02.67
එහි පිහිටි සියලුම අයිතීන් සමග.

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ආර් ගායත්‍රී විසින් සහතික කරන ලද 2013 මාර්තු මස 27 වැනි දිනැති අංක 433 දරන උකස්කරය ප්‍රකාර, මඩකලපුව පදිංචි පොන්නුතුරෛ සුතාහරන් හෙවත් පොන්නුතුරෛ සුතාකරන් සහ නඩරාසා වාසුකී හෙවත් වාසුකි සුතාකරන් හෙවත් නඩරාසා විසින් (මින්මතු බද්ධ අයදුම්කරුවන් ලෙස හැඳින්වෙන) ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 පෙබරවාරි මස 12 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට සහ පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. (පිළිවෙලින්)

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පලාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 135,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ පීඑල්සී නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි."

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-637